සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 7 | විෂයය / பாடம் / Subject: ක්‍රිස්තු ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- .......................................................................................... විභාග අංකය :- ...........................

**සැලකිය යුතුයි:**

- සුදුසු පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) 'මැවිල්ලේ මුදුන් මල්කඩ' වන්නේ,
(1) මනුෂ්‍යයා (2) කුරුල්ලන් (3) සත්වයින් (4) ගස්

(02) දෙවියන් වහන්සේ විසින් මවන ලද 'ප්‍රධාන ආලෝක දෙක' වන්නේ,
(1) ඉර, තාරකා (2) හඳ, තාරකා
(3) ඉර, හඳ (4) තරු

(03) ස්නාවක ජොහාන්ගේ පියා වන්නේ,
(1) මෝසෙස් (2) ජොසප් (3) සෙකරියස් (4) පේදුරු

(04) දෙවියන්වහන්සේ මිනිසාව මවනු ලැබුවේ ................................ දිනයේ දී ය.
(1) 1 (2) 2 (3) 6 (4) 4

(05) 'ශ්‍රී ලංකාවේ බයිබල් සමාගම' ආරම්භ කළ වර්ෂය වන්නේ,
(1) 1921 (2) 1912 (3) 1012 (4) 1812

(06) ජේසුස් වහන්සේ කුරුසියේ දී පවසන ලද වචන සංඛ්‍යාව වන්නේ,
(1) 7 (2) 8 (3) 3 (4) 6

(07) ජේසුස් වහන්සේ උත්ථාන වූ බව විශ්වාස නොකල තැනැත්තා වන්නේ,
(1) පේදුරු (2) ජොහාන්
(3) ජාකොබ් (4) තෝමස්

(08) පෙන්තකොස්ත දිනයේ බෞතිස්ම ලැබූ පුද්ගලයින් සංඛ්‍යාව වන්නේ,
(1) 3000 (2) 3200 (3) 2000 (4) 1200

(09) මුල් සභාව තුළ පැවති ගුණාංගයක් නම්,
(1) දේපළ බෙදා ගැනීම
(2) තනතුරු බෙදාදීම
(3) ගෝලයන් පමණක් නායකත්වය භාර ගැනීම
(4) සියල්ල පොදුවේ තබා ගැනීම



Department of Education – Western Province

(10) ජේසුස් වහන්සේගේ බලය පෙන්වීම කරන්නැයි කිවූ පරීක්ෂාව,

(1) ගල් පාන් බවට පත් කිරීම

(2) සාතන්ට නමස්කාර කිරීම

(3) කොත මුදුනින් පහතට පැනීම

(4) ඉහත සියල්ල ම

(11) ජේසුස් වහන්සේ විසින් ගෝලයන්ගේ පාද සේදීම ඇසුරෙන් පෙන්වූ ගුණාංගය වන්නේ,

(1) නිහතමානීකම (2) ආදරය

(3) නායකත්වය (4) කමාව

(12) එක් කෙනෙකුවත් විනාශ නොවිය යුතු බව පැහැදිලි කළ උපමාව

(1) නැතිවූ බැටළුවා (2) වපුරන්නාගේ උපමාව

(3) යහපත් සමරිතයා (4) අබ ඇටය

(13) දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වන්නට සුදුස්සන් වන්නේ,

(1) රෝගීන් ය (2) ළමයින් ය

(3) අන්ධයන් ය. (4) කාන්තාවන්

(14) 'මම මෙසියස් දුටුවෙමි' යනුවෙන් පැවසූ කාන්තාව ජීවත් වූයේ,

(1) සමාරියේ ය. (2) ගලිලයේ ය.

(3) ජේරුසලමේ ය. (4) ඊජිප්තුවේ ය.

(15) පුරාණ ගිවිසුමට අයත් ග්‍රන්ථ සංඛ්‍යාව වන්නේ,

(1) 27 (2) 39 (3) 28 (4) 66

(16) පරණ ගිවිසුම මුලින් ම ලියවුණු භාෂාව වන්නේ,

(1) ග්‍රීක් (2) හෙබ්‍රෙව් (3) ඉංග්‍රිසි (4) උර්දු

(17) 'බිබ්ලෝස්' යන්නෙහි අර්ථය කුමක් ද?

(1) පුස්තකාලය (2) පොත් (3) පෑන (4) බයිබලය

(18) බුද්ධාගමට අදාලව ලියන ලද ශුද්ධ ලියවිලි ග්‍රන්ථය වන්නේ,

(1) ත්‍රිපිටකය (2) බයිබලය (3) කුරානය (4) භගවත් ගීතය

(19) ශ්‍රී ලංකාවට නොපැමිණි ස්වභාවික ව්‍යවසනය වන්නේ,

(1) සුනාමි (2) භූමිකම්පාව (3) ගිනිකඳු පිපිරීම (4) ගංවතුර

(20) සුදර්ශන දොරටුව අසල කොරකු සුවකළ ගෝලයන් වන්නේ,

(1) පේදුරු හා ජොහාන් (2) පේදුරු හා ජාකොබ්

(3) පේදුරු හා තෝමස් (4) පේදුරු හා ජුදාස්

Department of Education - Western Province

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

(01) කෙටි පිළිතුරු සපයන්න.

(1) 'රන් අණ' යනු කුමක් ද?

(2) ජේසුස් වහන්සේ මුහුණ දුන් පරීක්ෂා මොනවාද?

(3) ස්නාවක ජොහාන්තුමාගේ ආහාර හා වස්ත්‍රය මොනවා ද?

(4) මිනිසාට මැවිල්ල ගැන ඇති වගකීම් 2ක් ලියන්න.

(5) ජේසුස් වහන්සේගේ මුල් ගෝලයන් 4 දෙනාගේ නම් ලියන්න.

(6) ජේසුස් වහන්සේගේ උපත ගැන සඳහන් වන සුභාරංචි 2ක් ලියන්න.

(7) මුල් සභාව තුළ පැවති විශේෂ ගුණාංග 02ක් ලියන්න.

(8) ජේසුස් වහන්සේ කුරුසිපත් වීමට පෙර ගිය ස්ථානයේ නම ලියන්න.

(9) ආරම්භයේ දී පරණ ගිවිසුම හා නව ගිවිසුම ලියන ලද භාෂාවන් මොනවා ද?

(10) අද ලෝකය තුල ජීවත් වීමේ දී .................. හා .................. ලෙස ජීවත් විය යුතුයි.

(02) (1) බයිබලය පරිවර්තනය කළ දෙදෙනෙක් නම් කරන්න.

(2) බයිබලයේ වැදගත්කම ගැන කරුණු 03ක් ලියන්න.

(3) බයිබලයේ සඳහන් චරිත 05ක් නම් කොට ඔවුන්ගෙන් ඔබට ඉගෙන ගත හැකි පාඩම ලියන්න.

(03) (1) බයිබලයේ 'ළමයින්' ගැන ජේසුස් වහන්සේ පැවසූ වදන් 02ක් ලියන්න.

(2) අද ළමයින් මුහුණ පාන ප්‍රශ්න 03ක් සඳහන් කරන්න.

(3) එම ප්‍රශ්නවලට අප මුහුණ දෙන ආකාරය පැහැදිලි කරන්න.

(04) (1) ජේසුස් වහන්සේ උත්ථාන වූ බව පළමුවෙන් ම දුටු අය නම් කරන්න.

(2) තෝමස් ඒ බව පිළිගැනීම ප්‍රකාශ කළ වදන ලියන්න.

(3) කුරුසියේ ජීවිතය අප වෙනුවෙන් පුජාකළ ජේසුස්වහන්සේට තුති පුදා යාච්ඤාවක් ලියන්න.

(05) (1) සාතන්ගේ පරීක්ෂාවට ජේසුතුමා ලක්වූ ස්ථානය කුමක් ද?

(2) ජේසුස්වහන්සේ පරීක්ෂාවලට මුහුණදුන් ආකාරය විස්තර කරන්න.

(3) ඔබ සමාජයේදී මුහුණ දෙන පරීක්ෂා 05ක් ලියා එයින් මිදීමට ක්‍රියාකරන ආකාරය ලියන්න.

(06) (1) ජුදෙව් පෙන්තකොස්ත මංගල්‍යය යනු කුමක් ද?

(2) ගෝලයන් වෙත ශුද්ධාත්මයානන් වැඩම කළ ආකාරය විස්තර කරන්න.

(3) ශුද්ධාත්මයාණන් වහන්සේ අප තුළ සිටින විට අපගේ ජීවිතය කුමනාකාර ද? විස්තර කරන්න.

(07) (1) පහත සඳහන් 03ක් ගැන කෙටියෙන් ලියන්න.

(1) බයිබලය (2) ශ්‍රී ලංකාවේ බයිබල් සමාගම

(3) ජේසුතුමා අපට ආදරෙයි (4) ස්වභාවික විපත්වල දී කිතුනු සේවය

(ලකුණු 5 × 2 = 10)

Department of Education – Western Province